## මාධ්‍ය නිවේදනය

### ජාතික ගිණුම් ඇස්තමේන්තු; 2020 වර්ෂයේ දෙවන කාර්තුව


**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**

**මුදල් අමාත්‍යාංශය**

දු.ක. 94-11-2147071 ෆැක්ස්: 94-11-2877938 ඊමේල්: national.accounts@statistics.gov.lk


…………………………………………………………………………………………….

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2020 දෙවන කාර්තුව (අප්‍රියෙල් 01 සිට ජූනි 30 දක්වා) සඳහා දළ දේශීය නිෂ්පාදිතය සහ අනෙකුත් සාර්ව ආර්ථික දර්ශක නිෂ්පාදන ප්‍රවේශය අනුව පවත්නා මිල ගණන් යටතේ සහ ස්ථාවර මිල ගණන් (2010) යටතේ ඇස්තමේන්තු කර නිකුත් කොට/ ප්‍රකාශයට පත්කොට ඇත.

කෙසේ වෙතත්, මෙම කාර්තුවේ දී කෝවිඩ්-19 වසංගතයේ බලපෑම හේතුවෙන්, ශ්‍රී ලංකාවේ ආර්ථිකය නියෝජනය කරන ආර්ථික කටයුතු වැඩි ප්‍රමාණයක් පසුබෑමට ලක් විය. මේ නිසා දෙවන කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිතය ඇස්තමේන්තු කිරීමට පෙර මෙම වසංගත කාලය තුල ආර්ථිකයේ සෑම අංශයකම හැසිරීම වඩාත් සැළකිළිමත් ලෙස නිරීක්ෂණය කිරීම වැදගත් විය. ඒ අනුව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව කඩිනමින් පහත පියවරයන් අනුගමනය කරන ලදී.

- රටේ ආර්ථිකයට කෝවිඩ්-19 වසංගතයේ බලපෑම තක්සේරු කිරීම සඳහා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් කඩිනමින් සමීක්ෂණයක් සැලසුම් කරන ලදී. මෙම ව්‍යවසාය ආයතන හා සම්බන්ධ ශ්‍රී ලංකාවේ කර්මාන්ත, ඉදිකිරීම්, වෙළඳ හා වෙනත් සේවා අංශ කෙරෙහි කෝවිඩ් - 19 හි බලපෑම පිළිබඳ සමීක්ෂණය ජූනි මස මැද භාගයේ සිට 2020 ජූලි මස අවසානය දක්වා පවත්වන ලද අතර මෙම සමීක්ෂණය මගින් එම එක් එක් ආයතනයේ 2019 හා 2020 වසර වල ජනවාරි මාසයේ සිට මැයි මාසය දක්වා සිදුකරන ලද ආර්ථික කටයුතු පිළිබඳ තොරතුරු රැස් කරන ලදී. මෙම සමීක්ෂණය රටේ කර්මාන්ත හා සේවා අංශයේ විශාල, මධ්‍යම, කුඩා හා ක්ෂුද්‍ර මට්ටමේ ව්‍යාපාර ආවරණය වන පරිදි ආයතන 18,000ක පමණ නියැදියකින් සමන්විත විය.

- මීට අමතරව, සෞඛ්‍ය අමාත්‍යාංශයේ වගකිව යුතු නිලධාරීන් සමඟ සිදු කරන ලද සාකච්ඡා අනුව ජාතික ගිණුම් ඇස්තමේන්තු කිරීම සඳහා අවශ්‍ය වූ සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් මහජන සෞඛ්‍ය සේවා සැපයීම වෙනුවෙන් දරන ලද විශේෂ වියදම්, විශේෂයෙන් කෝවිඩ් -19 සම්බන්ධ සෞඛ්‍ය සේවා (නිරෝධායන මධ්‍යස්ථාන සේවා, වැඩ කල අමතර පැය ගණන, දෙවන කාර්තුවට අදාළ නොගෙවූ බිල්පත් වැනි) පිළිබද දත්ත ලබා ගන්නා ලදී.

- තවද, හෝටල් කර්මාන්තය, පෞද්ගලික රෝහල්, දේපළ වෙළඳාම් සමාගම් සහ සිල්ලර වෙළඳ අංශ යනාදිය වැනි තෝරාගත් අංශ කිහිපයක් සඳහා ශ්‍රී ලංකාවේ කොළඹ කොටස් වෙළඳපොලේ ලියාපදිංචි ලැයිස්තුගත සමාගම්වල වාර්ෂික හා කාර්තුමය මූල්‍ය ප්‍රකාශන භාවිතා කරමින් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ජාතික ගිණුම් අංශයේ කාර්ය

මණ්ඩලය විසින් විශේෂ අධ්‍යයනයක් සිදු කරන ලදී. එම ආයතනවල, විශේෂයෙන් දෙවන කාර්තුවේ මූල්‍ය ප්‍රකාශන අධ්‍යයනය කිරීම මගින් එම ව්‍යාපාරයන්හි සිදුවූ පසුබෑම පැහැදිලිව නිරීක්ෂණය කිරීමට හැකි විය.

- ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ජාතික ගිණුම් අංශයේ කාර්ය මණ්ඩලය විසින් රටේ අනෙකුත් පුද්ගලික සේවා, වෘත්තීය සේවා සහ දේපළ වෙළඳාම් වැනි සේවා අංශයේ ව්‍යාපාර සඳහා කොවිඩ්-19 වසංගතයේ බලපෑම තක්සේරු කිරීම සඳහා දුරකථන සමීක්ෂණයක් මගින් තවත් විශේෂ අධ්‍යයනයක් සිදුකරන ලදී.
- ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ජාතික ගිණුම් අංශයේ කාර්ය මණ්ඩලය විසින් රට වසා දැමීමේ කාලය තුළ සිදු කරන ලද ජංගම වෙළඳාම පිළිබඳ තොරතුරු එක්රැස් කරමින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් දත්ත ලබා ගැනීමට කටයුතු කරන ලදී. රට වසා දැමීමේ කාලය තුළ සිල්ලර වෙළඳ ක්‍රියාකාරකම් සහ භාණ්ඩ ප්‍රවාහන කටයුතු සිදු කළ ආකාරය එම තොරතුරුවලින් පිළිබිඹු විය.

ඉහත අධ්‍යයනයන්හි තොරතුරු, විශේෂයෙන් ශ්‍රී ලංකාවේ කර්මාන්ත, ඉදිකිරීම්, වෙළඳ හා වෙනත් සේවා අංශ කෙරෙහි කෝවිඩ් - 19 හි බලපෑම පිළිබඳ සමීක්ෂණයේ ප්‍රතිඵල සහ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය විසින් සිදු කරන ලද වෙනත් විශේෂ අධ්‍යයනවල ප්‍රතිඵල භාවිතා කරමින් 2020 වර්ෂයේ දෙවන කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිතය වඩාත් නිවැරදිව ඇස්තමේන්තු කිරීමට කටයුතු කරන ලදී.

2020 දෙවන කාර්තුවේ ස්ථාවර මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය ඇස්තමේන්තු කර ඇති අතර එය 2019 දෙවන කාර්තුවේ වාර්තා වූ සියයට 1.1 ධන වර්ධනය හා සසඳන විට මෙතෙක් වාර්තා නොවූ ලෙස සියයට 16.3 කින් පහත වැටී ඇත. එය ශ්‍රී ලංකා ඉතිහාසයේ මෙතෙක් වාර්තා වූ විශාලතම පහත වැටීමයි. 2020 දෙවන කාර්තුවේදී, ඉතා සුළු රටවල් සංඛ්‍යාවක හැර (උදා: චීනය හා වියට්නාමය) මුළු ලෝකයේම බොහෝමයක් ආර්ථිකයන්හි (උදා:මාලදිවයින, ඉන්දියාව, සිංගප්පූරුව, තායිලන්තය, මැලේසියාව ආදී..) විශාල පසුබෑසීම් වාර්තා වී ඇත. මෙම කාර්තුව පිළිබඳව සලකා බලන විට, මාර්තු 19 සිට අප්‍රේල් 20 දක්වා කාලය තුළ මුළු රටම සම්පූර්ණයෙන් වසා දමා තිබුණි. ඉන් පසුව දිස්ත්‍රික්ක වෙත පැනවූ ඇඳිරි නීතිය ක්‍රමයෙන් ඉවත් කරන ලදී. කෙසේ වෙතත්, මැයි 26 වන දින දක්වා ප්‍රධාන කාර්මික කලාප සහ ව්‍යාපාරික ස්ථාන වැඩි ප්‍රමාණයක් පිහිටා ඇති ප්‍රධාන දිස්ත්‍රික්ක දෙක සඳහා (කොළඹ සහ ගම්පහ) පැනවූ ඇඳිරි නීතිය තව දුරටත් ක්‍රියාත්මක විය. කොවිඩ් -19 රෝගය ප්‍රජාව අතර පැතිරීම පාලනය කිරීම සඳහා රජය මගින් මෙම ඇඳිරි නීතිය පැනවූ අතර එමගින් රජය සාර්ථක ප්‍රතිඵල ලබා ගන්නා ලදී.

කෙසේ වුවත් මෙම තත්ත්වය රටේ ආර්ථික කටයුතු වැඩි ප්‍රමාණයකට අහිතකර ලෙස බලපා ඇති අතර, විශේෂයෙන් නිෂ්පාදන, ඉදිකිරීම්, මගී ප්‍රවාහනය (ගොඩබිම සහ ගුවන්), පතල් හා කැණීම් කර්මාන්තය, සංචාරක කර්මාන්තය , වෙනත් පුද්ගලික සේවා, වෘත්තීය සේවා, සිල්ලර වෙළඳාම යන ආර්ථික කටයුතු සහ සමුද්‍රීය මසුන් ඇල්ලීම වැනි කෘෂිකර්මාන්තයේ සමහර ක්‍රියාකාරකම් කෙරෙහි බලපෑම් ඇති කරමින් සෘණ වර්ධන වේගයන් වාර්තා කර ඇත.

2020 දෙවන කාර්තුව සඳහා ජාතික ගිණුම් ඇස්තමේන්තු ප්‍රකාශයට පත් කරමින් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව අනාවරණය කරන්නේ 2020 දෙවන කාර්තුව සඳහා ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන වේගය සියයට සෘණ 16.3 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති බවයි. 2019 දෙවන කාර්තුව සඳහා මෙම අගය සියයට 1.1 ක් ලෙස ධන වර්ධන වේගයක් වාර්තා විය. 2020 දෙවන කාර්තුවේ ශ්‍රී ලංකාව සඳහා දළ දේශීය නිෂ්පාදිතය ස්ථාවර මිල අනුව රු. මිලියන 1,936,273 ක් දක්වා

පහත වැටී ඇති අතර 2019 දෙවන කාර්තුවේදී එම අගය රු. මිලියන 2,312,078 ක් ලෙස වාර්තා විය. මීට අමතරව, 2019 දෙවන කාර්තුවේදී ශ්‍රී ලංකාව සඳහා වන දළ දේශීය නිෂ්පාදිතය පවත්නා මිලට අනුව රු. මිලියන 3,589,246 ක් වූ අතර එය 2020 දෙවන කාර්තුවේ දී රු. මිලියන 3,012,013 ක් දක්වා පහළ බැස ඇති අතර එය සියයට 16.1 ක පහල යාමකි.

2020 දෙවන කාර්තුවේදී ආර්ථිකයේ ප්‍රධාන අංශ වන 'කෘෂිකර්මාන්ත', 'කර්මාන්ත', 'සේවා' සහ 'භාණ්ඩ මත ලබාදුන් සහනාධාර අඩු කරන ලද බදු' පිළිවෙලින් සියයට 9.7ක්, සියයට 24.8ක්, සියයට 61.2ක් සහ සියයට 4.3කින් දළ දේශීය නිෂ්පාදිතය කෙරෙහි දායක වී ඇත. කෝවිඩ්-19 වසංගතයේ බලපෑම, ආර්ථික ක්‍රියාකාරකම් වැඩි ප්‍රමාණයක් කෙරෙහි අහිතකර ලෙස බලපෑම හේතුවෙන් රටේ සමස්ත ආර්ථිකය මන්දගාමී විය. 2020 දෙවන කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිතයේ ඇස්තමේන්තු අනුව කෘෂිකාර්මික, කාර්මික හා සේවා ප්‍රධාන ආර්ථික ක්‍රියාකාරකම් තුනම පිළිවෙලින් සියයට 5.9ක්, සියයට 23.1ක් සහ සියයට 12.9 කින් පසුබැසීම් වාර්තා වී තිබේ. මීට අමතරව, 2020 දෙවන කාර්තුවේදී, "භාණ්ඩ මත ලබාදුන් සහනාධාර අඩු කරන ලද බදු" 2019 දෙවන කාර්තුව හා සසඳන විට සියයට 30.1 ක අඩුවීමක් වාර්තා කර ඇත. මෙයට හේතු වී ඇත්තේ බදු ප්‍රතිපත්ති සංශෝධනය කිරීම හේතුවෙන් බදු අනුපාත සහ බදු අය කරනු ලබන ආදායම් සීමා වෙනස් වීම මත බදු ආදායමේ විශාල පහත වැටීමයි. රටේ සමස්ත දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය මන්දගාමී වීම සඳහා මෙය බලපා ඇත.

**කෘෂිකර්මාන්ත අංශය**

පසුගිය වසරේ දෙවන කාර්තුව හා සසඳන විට 2020 දෙවන කාර්තුවේදී කෘෂිකාර්මික කටයුතුවල පසුබෑමට 'කරදිය මසුන් ඇල්ලීම' (සියයට 39.1), 'තෙල් සහිත පලතුරු භෝග වගාව (සියයට 14.2), 'තේ වගා කිරීම' (සියයට 10.5), 'රබර් වගා කිරීම'' (සියයට 11.5), 'වන වගාව සහ දැව කැපීම' (සියයට 27.3) සහ 'සත්ව නිෂ්පාදනය' (සියයට 1.6) යන ආර්ථික කටයුතුවල සිදුවූ පසුබෑම ප්‍රධාන වශයෙන් හේතු විය. එසේ වුවද, 'ධාන්‍ය වගා කිරීම' (සියයට 124.7), 'වී වගා කිරීම' (සියයට 17.2), 'එළවළු වගා කිරීම' (සියයට 12.9), 'පලතුරු වගා කිරීම ' (සියයට 6.3), 'කුළුබඩු වගා කිරීම ' (සියයට 4.7) සහ 'මිරිදිය මසුන් ඇල්ලීම' (සියයට 11.0) වැනි ආර්ථික කටයුතු 2020 දෙවන කාර්තුවේදී තවදුරටත් වර්ධනය වී ඇත.

**කර්මාන්ත අංශය**

2020 දෙවන කාර්තුවේදී, කෝවිඩ් - 19 වසංගතයේ අහිතකර බලපෑම පෙන්නුම් කරමින් සමස්ත කාර්මික ක්‍රියාකාරකම් තව දුරටත් සියයට 23.1 කින් විශාල ලෙස පහත වැටී ඇත. 2020 දෙවන කාර්තුවේදී කාර්මික නිෂ්පාදන පිළිබඳ දර්ශක ද පහත වැටී ඇති පසුබිමක ශ්‍රී ලංකාවේ සමස්ත නිෂ්පාදන කර්මාන්තය සියයට 20.0ක ඍණාත්මක වර්ධනයක් වාර්තා කර ඇත. මෙයට හේතුව දිවයිනේ බොහෝ දිස්ත්‍රික්කවල අප්‍රේල් සිට මැයි මැද දක්වා ඇඳිරි නීතිය පැනවීම හේතුවෙන් නිෂ්පාදන ක්‍රියාවලීන් තාවකාලිකව නතර වීමයි. නිෂ්පාදන කටයුතුවල පසුබෑමට ප්‍රධාන වශයෙන් 'රෙදිපිළි, ඇඟලුම් හා සම් ආශ්‍රිත නිෂ්පාදන' ක්‍රියාකාරකම බලපා ඇති අතර එය මෙම කාර්තුවේදී සියයට 44.2 ක ඍණ වර්ධනයක් වාර්තා කළේය. ඊට අමතරව, 'රබර් හා ප්ලාස්ටික් නිෂ්පාදනය' (සියයට 42.0), 'ගෘහ භාණ්ඩ නිෂ්පාදනය' (සියයට 35.2), 'කෝක් හා පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන' (සියයට 25.4), 'වෙනත් ලෝහමය නොවන නිෂ්පාදන' (සියයට 20.9), 'අනෙකුත් නිෂ්පාදන' (සියයට 20.6) සහ 'රසායනික නිෂ්පාදන හා මූලික ඖෂධ නිෂ්පාදනය' (සියයට 12.7) වශයෙන් ඍණ වර්ධන අනුපාත වාර්තා කර ඇත. මේ අතර, රටේ කාර්මික අංශයට ඉහළම දායකත්වය සපයන 'ආහාර, පාන සහ දුම්කොළ නිෂ්පාදනය' ක්‍රියාකාරකම 2020 දෙවන කාර්තුවේදී සියයට 0.2 ක සුළු පහල යාමක් වාර්තා කර තිබේ.

කර්මාන්ත අංශයෙන් සියයට 6.8ක දායකත්වයක් සපයන 'ඉදිකිරීම් කර්මාන්තය' මෙම කාර්තුවේදී සැලකිය යුතු ලෙස සියයට 30.1 ක පසුබැස්මක් වාර්තා කර ඇති අතර එය කොවිඩ්-19 වසංගතයේ විශාල බලපෑමකට ලක් වී ඇති බව පෙන්නුම් කරයි. ඉදිකිරීම් කටයුතුවල පහත වැටීම නිසා, 2020 දෙවන කාර්තුවේදී 'පතල් හා කැණීම් කර්මාන්තය' ද සියයට 28.4ක ඍණ වර්ධන වේගයක් වාර්තා කර ඇත. මීට අමතරව, 'විදුලිය, ගෑස් හා වාසැකසුම් කර්මාන්තය' සියයට 10.3ක පසුබැස්මක් වාර්තා කර ඇත. කාර්මික අංශයෙන් විදුලිය සඳහා ඇති ඉල්ලුම අඩුවීම මේ සඳහා බලපා ඇත. මේ අතර, 'ජලය එකතු කිරීම, පිරිපහදු කිරීම සහ සැපයීම' (සියයට 3.7) සහ 'මලාපවහන, අපද්‍රව්‍ය කළමනාකරණය හා ප්‍රතිචක්‍රීකරණය' (සියයට 3.3) මෙම කාර්තුවේ ධන වර්ධන අනුපාත වාර්තා කර ඇත.

**සේවා අංශය**

2020 දෙවන කාර්තුව තුළ සේවා අංශයේ සියයට 12.9 ක සැලකිය යුතු පසුබෑමක් වාර්තා වී ඇත. විශේෂයෙන් 'නවාතැන් හා ආහාරපාන සැපයීම' (සියයට 63.5), 'භාණ්ඩ හා මගීන් ප්‍රවාහනය' (සියයට 36.1), 'වෙනත් පුද්ගලික සේවා' (සියයට 31.5), 'දේපළ වෙළඳාම් ක්‍රියාකාරකම්' (සියයට 16.9), 'වෘත්තීය සේවා' (සියයට 14.5) සහ 'තොග හා සිල්ලර වෙළඳාම' (සියයට 1.5) යන ක්‍රියාකාරකම් වල පසුබැසීම් පෙන්නුම් කර ඇත. කෙසේ වෙතත්, මෙම වසංගතය මධ්‍යයේ වුවද 'විදුලි සංදේශ කටයුතු' (සියයට 19.6), 'තොරතුරු තාක්ෂණ වැඩසටහන් උපදේශනය සහ ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම්' (සියයට 15.1), 'මූල්‍ය සේවා ක්‍රියාකාරකම්' (සියයට 9.9) හි ධන වර්ධන වේගයන් වාර්තා කර ඇත.

2020 දෙවන කාර්තුවට අදාල ජාතික ගිණුම් ඇස්තමේන්තු පිළිබඳව විස්තරාත්මක තොරතුරු ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ www.statistics.gov.lk/NationalAccounts /StaticalInformation/GDP වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කොට ඇති බව දෙපාර්තමේන්තුව පවසයි.

පී. එම්. පී. අනුර කුමාර
අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ.)